# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1354 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 22/08/2024
පැය 0525

## මාධ්‍ය නිවේදනය

**01.** **අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.08.21 වන දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ ජපන් මිත්‍රත්ව පාලම අසලදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පැලියගොඩ පොලිස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02.** **අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකාරියක් අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2024.08.21 වන දින දහවල් කාලයේ පානදුර දකුණ පොලිස් වසමේ වලාන හන්දියේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 780 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 34 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කළුතර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමග සැකකරුවකු අත්අඩංගුවට - ජාඇල පොලිස් ස්ථානය.**

2024.08.21 වන දින රාත්‍රී කාලයේදී ජාඇල පොලිස් වසමේ දඬුගම ප්‍රදේශයේදී ජාඇල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමග සැකකරුවකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.**

2024.08.21 වන දින දහවල් කාලයේදී ගම්පහ පොලිස් වසමේ අස්ගිරිය ප්‍රදේශයේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.08.21 වන දින උදෑසන කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 120 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. විදේශීය දුම්වැටි සමග සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2024.08.21 වන දින සවස් කාලයේ අළුත්ගම පොලිස් වසමේ දර්ගා නගරයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වන දර්ගා නගරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ආරුගම්බේ පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.08.21 වන දින රාත්‍රී කාලයේදී පොතුවිල් පොලිස් වසමේ කෝමාරි ප්‍රදේශයේදී ආරුගම්බේ පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක්කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා මරණ ලද සතෙකුගේ මස් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස් අවුරුදු 47 ක් වූ සෙල්වපුරම්, කෝමාරි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. පතල් වලකට වැටී පුද්ගලයෙකු මියයාමක් - ලග්ගල පොලිස් වසම.

2024.08.21 වන දින උදෑසන කාලයේ ලග්ගල පොලිස් වසමේ තලගොයිආර ප්‍රදේශයේදී පතලක සේවය කරන ලද පුද්ගලයෙකු පතලකට වැටී මියගොස් ඇති බවට ලග්ගල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ දුන්කල වත්ත, මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලග්ගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**